සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2018**

2018.08.15 / 1300 - 1500

| | | | |
|---|---|---|---|
| **දේශපාලන විද්‍යාව I**<br>அரசியல் விஞ்ஞானம் I<br>Political Science I | **23** | **S** | **I** | 

**පැය දෙකයි**
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
* එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

● අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

**1.** දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ:
A - දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සහ එමගින් ජනතාවට වන බලපෑම තේරුම් ගැනීමට ය.
B - යහපාලනයේ සහ අයහපත් පාලනයේ වෙනස්කම් තේරුම් ගැනීමට ය.
C - රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ආධ්‍යාත්මික පදනම පිළිබඳව දැනගැනීමට ය.
D - ආණ්ඩුවේ බලාධිකාරී තීරණ ගැනීම හා සම්බන්ධ ක්‍රියාදාම පිළිබඳව තේරුම් ගැනීමට ය.
E - දේශීය හා ජාත්‍යන්තර තලයන්හි බල අරගලය කරන්නාවූ මාර්ග සහ විධික්‍රම තේරුම් ගැනීමට ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**2.** දේශපාලනය:
A - ආණ්ඩුව පිළිබඳ කලාව මෙන්ම විද්‍යාව ද වේ.
B - අගය කිරීම් බලාධිකාරී බලය යොදවා බෙදාහරින විධික්‍රමය වේ.
C - සමාජ-ආර්ථික හා දේශපාලන ගැටලු අරබයා පවතින ප්‍රතිවිරෝධ අදහස් අතර ඇතිවන ගැටුම්වල ප්‍රතිඵලය වේ.
D - ආගමික අගය කිරීම් පදනම් කරගත් සමාජයක් ගොඩනැගීමේ සදාචාරාත්මක ක්‍රියාවලියක් වේ.
E - දේශපාලන විද්‍යාවේ ප්‍රායෝගික පැත්ත ලෙස සැලකේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**3.** මිනිසුන් රාජ්‍ය ලෙස සංවිධාන වී ඇත්තේ ඇයි?
A - සමාජය තුළ පවතින විෂමතා ආරක්ෂා කර පවත්වා ගෙන යාමට ය.
B - සමාජය පාලනය කිරීම සඳහා පාලන ක්‍රමයක් ගොඩනගා ගැනීමට ය.
C - ජාතික ආරක්ෂාව සුරක්ෂිත කොට පවත්වා ගෙන යාමට ය.
D - සමාජයේ ආර්ථික කාර්යයන් විධිමත් ලෙස සංවිධානය කර ගැනීමට ය.
E - ජනතා පරමාධිපතිත්වය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සුජාතභාවය ලබා ගැනීමට ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**4.** දේශපාලන වශයෙන් සංවිධානය වූ සමාජයකට ආණ්ඩුවක් අවශ්‍ය වන්නේ ඇයි?
A - සමාජ ඒකාග්‍රතාව ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ය.
B - සමාජයේ දිළිඳු කොටසේ අභිලාෂ පමණක් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ය.
C - ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ය.
D - නීතිය, ස්ථාවරභාවය, ආරක්ෂාව සහ සමාජ සාධාරණත්වය සැපයීම හා පවත්වා ගෙන යාම සඳහා ය.
E - ආර්ථික කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම හා බාහිර සම්බන්ධතා කළමනාකරණය කිරීම සඳහා ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[දෙවැනි පිටුව බලන්න.

**5.** ස්වාධිපත්‍ය බලය:

A - රාජ්‍යයේ බලය පිළිබඳව සැලකිලිමත් වන දේශපාලන න්‍යාය වේ.
B - දේශීය සහ ජාත්‍යන්තර දේශපාලනය හසුරුවන ප්‍රධානතම න්‍යායාත්මක සංකල්පය වේ.
C - සමාජයට සහ අනෙක් සමාජ සංවිධානවලට ඉහළින් රාජ්‍යය අසහායත්වයට පත් කරන දේශපාලන සිද්ධාන්තය වේ.
D - රාජ්‍ය කැමැත්ත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සුජාතභාවය සපයන දේශපාලන න්‍යාය වේ.
E - සන්ධීය දේශපාලන ක්‍රමයක් තුළ පවා අසහාය සහ බෙදිය නොහැකි බවට සලකනු ලැබේ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**6.** ධනවාදය:

A - ආරම්භක අවස්ථාවේ දී ගොඩනැගුවේ රාජ්‍ය නිර්බාධවාදී මූලධර්මය පදනම් කරගෙන ය.
B - පූර්ණ වෙළෙඳපොළ තරඟය වර්ධනය කිරීම ඉලක්ක කොටගෙන ඇත.
C - 'වෙළෙඳපොළ ආර්ථිකය පාලනය නොකරන විට නිරායාසයෙන්ම සමතුලිතභාවය කරා ගමන් කරනු ඇත' යන විශ්වාසය මත ගොඩනගා ඇත.
D - නිදහස් වෙළෙඳපොළ ධනවාදය සහ රාජ්‍ය ධනවාදය යන ආකෘති යටතේ නූතන ලෝකය තුළ ක්‍රියාත්මක වේ.
E - ආර්ථික වෘද්ධිය සමග යළි බෙදාහැරීම යන ප්‍රතිපත්තිය මගින් සමාජ සාධාරණත්වය ඇති කිරීම ගැන සැලකිලිමත් වේ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**7.** සමාජවාදය:

A - සමාන පුරවැසිභාවය සහ සමාන ඉඩප්‍රස්ථා යන මූලධර්මය පදනම් කරගත් සමාජ ක්‍රමයක් වේ.
B - නිෂ්පාදනය සහ බෙදාහැරීමේ මාධ්‍යයන් රාජ්‍ය අයිතිය පදනම් කරගත් ආර්ථික ක්‍රමයක් වේ.
C - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට විකල්ප දේශපාලන ක්‍රමයක් වේ.
D - බහු පක්ෂ ක්‍රමයක් පදනම් කරගෙන ක්‍රියාවට නැංවෙන පාලන ක්‍රමයක් වේ.
E - ධනවාදය මගින් නිර්මාණය කර ඇති සමාජ අසමානත්වය පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් සෙවීමට උත්සාහ දරන දේශපාලන මතවාදයක් වේ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**8.** සමාජ ප්‍රජාතන්ත්‍රවාදය:

A - වෙළඳපොළ ආර්ථික ක්‍රමයට සහ විප්ලවකාරී සමාජවාදයට විකල්පයක් වන ආර්ථික මාදිලියක් වේ.
B - වෙළඳපොළ ආර්ථික ක්‍රමය සහ සමාජ සාධාරණත්වය අතර එකඟතාවක් නිර්මාණය කිරීම පිළිබඳ ව සැලකිලිමත් වේ.
C - 'සමාජ වෙනස් වීම විප්ලවය මගින් කළ යුතු ය' යන මාක්ස්ගේ න්‍යාය පිළිගන්නා දේශපාලන න්‍යායක් වේ.
D - වෙළඳපොළ ආර්ථික ක්‍රමය, විකාශනාත්මක සමාජවාදය සහ සුබසාධක රාජ්‍ය ක්‍රමය යන මූල්ගල් තුන මත ගොඩනගා ඇත.
E - ප්‍රජාතන්ත්‍රවාදී මාර්ග මගින් සමාජවාදී සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම ඉලක්ක කරගෙන ඇත.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**9.** කැබිනට් ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ:

A - සත්‍ය සහ නාමික වශයෙන් හඳුන්වන ද්විත්ව විධායකයක පැවැත්ම
B - නාමික විධායකය විසින් ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් අතුරෙන් සත්‍ය විධායකය පත් කිරීම
C - සත්‍ය විධායකය සෘජුවම ව්‍යවස්ථාදායකයට වගකීම
D - විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර බලතල හා කාර්යයන් විධිමත් අයුරින් බෙදා නොතිබීම
E - නිශ්චිත නිල කාලයක් සඳහා ජනතාව විසින් සෘජුව පත් කරනු ලබන නාමික විධායකයක් තිබීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**10.** ජනාධිපති ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ:

A - එකිනෙකට වෙනස් මැතිවරණ දෙකකින් විධායකය සහ ව්‍යවස්ථාදායකය සෘජුව තෝරා පත්කර ගැනීම
B - විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර බලතල බෙදීම
C - සංවරණ හා තුලන මූලධර්මය මත විධායකය සහ ව්‍යවස්ථාදායකය සිය බලතල ක්‍රියාවට නැංවීම
D - විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පවතින සමීප සහයෝගිතාව
E - විධායකය සෘජුව ව්‍යවස්ථාදායකයට වගනොකීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[තුන්වැනි පිටුව බලන්න.

**11.** අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ:
A - ජනාධිපති සහ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයකින් සමන්විත ද්විත්ව විධායකයක් පැවතීම
B - ජනතාව විසින් ජනාධිපතිවරයා තෝරාපත් කිරීම සහ ජනාධිපතිවරයා විසින් අගමැති සහ කැබිනට් මණ්ඩලය පත් කරනු ලැබීම
C - අගමැති සහ කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට සෘජුව වගකීම
D - ජනාධිපතිධුරය රාජ්‍යයේ විධායක බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර ආයතනය වීම
E - අගමැතිවරයා ආණ්ඩුවේ නායකත්වය දැරීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**12.** ඒකතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ:
A - පාලකයා විසින් අත්තනෝමතික ලෙස රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම
B - ජනතාවගේ ආගමික විශ්වාස පාලකයා කඩකරන විට පාලකයා තනතුරින් ඉවත් කිරීමට ජනතාවට හැකි වීම
C - ජනතා කැමැත්ත නොසලකා හරිමින් පාලකයාගේ කැමැත්ත සමාජය මත පතිත කිරීම
D - තනි දේශපාලන පක්ෂයක පැවැත්ම හෝ දේශපාලන පක්ෂ මුළුමනින්ම නොපැවතීම
E - රාජ්‍යය සහ සිවිල් සමාජය අතර වෙනසක් නොපැවතීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**13.** ඒකීය ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ
A - මධ්‍යය සහ පරිධිය අතර බල හවුල්කාරිත්වය පදනම් කරගෙන රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම
B - මධ්‍යම ආණ්ඩුව විසින් අවධාරිත කරන ලද බලය සහිත පළාත් ආණ්ඩුක්‍රමයක පැවැත්ම
C - ඒකීය පුරවැසිභාවයක් පැවැතීම
D - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම පිළිබඳ මධ්‍යම ආණ්ඩුවේ ඒකාධිකාරිත්වය
E - සියලු ම උප-ජාතික ආණ්ඩුවලට ඉහළින් තිබෙන මධ්‍යම ආණ්ඩුවේ අසහාය ආධිපත්‍යය
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**14.** සන්ධීය ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ
A - ආණ්ඩුව ජාතික සහ උප-ජාතික වශයෙන් මට්ටම් දෙකකින් ව්‍යුහගත කර තිබීම
B - ස්වාධිපති බලය මධ්‍යය සහ පරිධිය අතර බෙදා තිබීම
C - සන්ධීය ක්‍රමයට නීතිමය පදනම සපයන ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීම
D - නීතිමය හෝ දේශපාලන වශයෙන් එකිනෙකට යටත් නොවන සමාන පාර්ශ්වකරුවන් සිටීම
E - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ මනා කාර්යක්ෂමතාවක් පැවතීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**15.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ දේශපාලන විධායකය
A - ආණ්ඩුක්‍රම යාන්ත්‍රණයේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර එය නොමැතිව කිසිදු ආණ්ඩුවකට ක්‍රියාත්මක විය නොහැකි ය.
B - ඡන්දදායකයන් විසින් තෝරාපත් නොකරන ලද අය විසින් ද දැරිය හැකි වේ.
C - කැබිනට්, ජනාධිපති සහ අර්ධ-ජනාධිපති යන ආකෘති අනුව සංවිධානය කර තිබේ.
D - නීති සහ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම පිළිබඳව වගකිව යුතු වේ.
E - එක් පුද්ගලයෙකුගෙන් හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන් හෝ සමන්විත කුඩා මණ්ඩලයක් වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

● අංක **16** සිට **25** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**16.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ ව්‍යවස්ථාදායකය
(1) සාමාන්‍යයෙන් සමන්විත වන්නේ ජනතාව තෝරාපත් කරන ගිහි දේශපාලනඥයන්ගෙනි.
(2) සමස්ත ජාතියම නියෝජනය කරන නියෝජිතයින්ගෙන් සමන්විත විශාල මණ්ඩලයක් වේ.
(3) විවාද කිරීමේ ප්‍රධාන ජාතික සභාව ලෙස සැලකේ.
(4) ආණ්ඩුවේ කාර්යයන්ට සුජාතභාවය සැපයීමේ වගකීම දරනු ලැබේ.
(5) ජාතික අයවැය සම්පාදනය කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ වගකීම දරනු ලැබේ.

**17.** නූතන දේශපාලන ක්‍රම තුළ අධිකරණය:
(1) ආණ්ඩුවෙන් ස්වාධීන වූ රාජ්‍ය ආයතනයක් වේ.
(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හෝ ව්‍යවස්ථාදායකය පනවන පනත් හෝ මගින් පිහිටුවනු ලැබේ.
(3) ඉහළ සහ පහළ වශයෙන් ස්ථර දෙකක් අනුව සංවිධානය කරනු ලැබේ.
(4) නීතිය විනිශ්චය කිරීමේ බලය පැවරෙන ආණ්ඩුවේ ශාඛාව වේ.
(5) විධායකයේ අධීක්ෂණයට යටත්ව තම කාර්යයන් ඉටු කළ යුතු වේ.

More Past Papers at
tamilguru.lk

**18.** නීතිය:
(1) රාජ්‍යය විසින් පනවනු ලබන පොදු රීති පද්ධතියක් වේ.
(2) මිනිසුන්ගේ ආධ්‍යාත්මික ජීවිතය පාලනය කිරීම පිළිබඳව සැලකිලිමත් වේ.
(3) සියලු දෙනාටම සමානව අදාළ වන බව පිළිගැනේ.
(4) දේශපාලන ක්‍රමයක් තුළ මිනිසුන්ට කළ හැකි හා කළ නොහැකි දේ විධානය කරන ප්‍රධාන දර්ශකය වේ.
(5) ජනතාවගේ නිදහස ආරක්ෂා කරන ප්‍රධාන ආරක්ෂකයා ලෙස සැලකේ.

**19.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
(1) ආණ්ඩුකරණයට නීතිමය පදනම සපයන නීති අන්තර්ගත ලියවිල්ල වේ.
(2) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකනු ලැබේ.
(3) දේශපාලකයින්ගේ අයිවාසිකම් හා යුතුකම් ආරක්ෂා කරන ලියවිල්ල ලෙස සලකනු ලැබේ.
(4) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාව පෙන්නුම් කරන ප්‍රධාන නීතිමය ලියවිල්ල වේ.
(5) ව්‍යවස්ථානුකූලවාදයේ වර්ධනයට පදනම සපයන ලියවිල්ල වේ.

**20.** සිවිල් සමාජය:
(1) පොදුවේ පිළිගත් අර්ථ නිරූපණයක් නොමැති සංකල්පයක් වේ.
(2) රාජ්‍ය පාලනයෙන් පරිබාහිරව පවතින සමාජ ජීවිතයේ එක් පැතිකඩක් එමගින් විස්තර කරනු ලැබේ.
(3) දේශපාලන සමාජයට අනන්‍ය වන බව පිළිගනු ලැබේ.
(4) විශේෂිත වූ මෙන්ම සීමිත අරමුණු කිහිපයක් උදෙසා පවතින සාමූහික සමාජ සංගතයක් ලෙස විස්තර කරනු ලැබේ.
(5) ස්වේච්ඡා සංවිධානවලින් සහ සමාජ කණ්ඩායම්වලින් ගොඩනැගී ඇත.

**21.** පුරවැසිභාවය:
(1) රටක ජීවත් වන සියලු දෙනාට ම හිමි නීතිමය අයිතිවාසිකමක් වේ.
(2) දේශපාලන සමාජයක ජීවත් වන පුරවැසියන්ට විශේෂිත ජාතිකත්වයක් ආරෝපණය කරන නීතිමය ව්‍යවහාරයක් වේ.
(3) උත්පත්තිය මගින් හෝ ලියාපදිංචි වීම මගින් හිමිකර ගත හැකි නීතිමය තත්ත්වයක් වේ.
(4) භුක්ති විඳින අයට දේශපාලන සමාජයක සමාන සහ පූර්ණ සාමාජිකත්වය හිමිකර දෙන නීතිමය තත්ත්වයක් වේ.
(5) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාවය නිරූපණය කරන නීතිමය තත්ත්වයක් වේ.

**22.** නියෝජනය:
(1) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය තුළ පාලකයින් සහ පාලිතයින් එකට සම්බන්ධ කරන ප්‍රධාන පුරුක වේ.
(2) තෝරාපත් කිරීමට සහභාගි වන අය සහ තේරීපත් වන අය අතර පවතින සම්බන්ධතාව පෙන්නුම් කරන නිර්නායකයක් වේ.
(3) ක්‍රියාවට නැංවිය හැක්කේ මැතිවරණ මගින් පමණි.
(4) භාරකාරත්වය, අවධාරිත කිරීම, අවසර දීම සහ සාදෘශ්‍යය (පෙනී සිටීම) යනුවෙන් විධි ක්‍රම හතරකින් යුක්ත වේ.
(5) දේශපාලන ක්‍රමයක දේශපාලන, ආර්ථික හා සමාජ කොටස්වලට සාධාරණ නියෝජනයක් සහතික කරන එකම ක්‍රමය වේ.

**23.** දේපළ:
(1) පෞද්ගලික, පොදු සහ රාජ්‍ය වශයෙන් වර්ග කිහිපයකින් සමන්විත වේ.
(2) දේපළ අයිතිය හෝ හිමිකම් පිළිබඳ අයිතිය ලෙස නීතියෙන් පිළිගෙන ඇත.
(3) චංචල හා නිශ්චල වශයෙන් කොටස් දෙකකට වර්ග කර ඇත.
(4) හිමිකමට, භුක්තිවිඳීමට, පැවරීමට, පාලනය කිරීමට, ආදායම් ඉපයීමට සහ විකිණීමට ඇති අයිතිය යන ගුණාංගවලින් යුක්ත වේ.
(5) කොමියුනිස්ට් පාලන ක්‍රම තුළ පවා මූලික මිනිස් අයිතියක් ලෙස පිළිගෙන ඇත.

**24.** අයිතිවාසිකම්:
(1) මානව අභිමානය තහවුරු කරන්නා වූ මනුෂ්‍යයන්ට හිමි දෙයක් වේ.
(2) බැඳීම් හා සමපාත වන බවට හඳුනාගෙන ඇත.
(3) නීතිමය හා සදාචාරාත්මක ලෙස දෙයාකාර ස්වරූපයක් ගනී.
(4) පුද්ගලයින්ගේ පෞද්ගලික වර්ධනය සහ ඔවුන්ගේ සාමූහික පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය යැයි පිළිගෙන ඇත.
(5) සාධනීය හා නිෂේධනීය වශයෙන් කොටස් දෙකකට වර්ග කර ඇත.

[පස්වැනි පිටුව බලන්න.

**25.** දේශපාලන පක්ෂ:
(1) මැතිවරණ මගින් හෝ වෙනත් මාර්ග මගින් හෝ ආණ්ඩු බලය ජයග්‍රහණය කිරීම අරමුණු කොටගෙන සංවිධානය වූ පුද්ගල කණ්ඩායම් වේ.
(2) ආඥාදායක පාලන ක්‍රම තුළ පවා ක්‍රියාත්මක වීමේ නිදහස භුක්ති විඳියි.
(3) වෘත්තීය, ක්‍රියාකාරී හා සාමාන්‍ය යනුවෙන් ත්‍රිවිධාකාර සාමාජිකයන්ගෙන් සමන්විත වේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ ජනතාවගේ දේශපාලන කැමැත්ත නියෝජනය කරන ප්‍රධාන ක්‍රියාධරයින් වේ.
(5) කේඩර සහ ජනතාවාදී, නියෝජන සහ අනුකලන, ව්‍යවස්ථානුකූල සහ විප්ලවකාරී, වාමාංශික හා දක්ෂිණාංශික වශයෙන් වර්ග කරනු ලැබේ.

- අංක **26** සිට **35** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දී ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**26.** 1833 කෝල්බෲක්-කැමරන් කොමිසම මගින් යෝජනා කරනු ලැබූයේ:
A - ආණ්ඩුකාරවරයාට අතිරේක බලතල පැවරීම මගින් ආණ්ඩුකාරවරයාගේ තත්ත්වය ශක්තිමත් කිරීම
B - විධායක සහ ව්‍යවස්ථාදායක කාර්යයන් කිරීම සඳහා ආණ්ඩුකාරයාට සහාය වීම පිණිස විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම
C - නිදහස් ශ්‍රම වෙළෙඳපොළ වර්ධනය වීමට මග පෑදීම උදෙසා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
D - උඩරට සහ මුහුදුබඩ පළාත් එක් කිරීම මගින් ලංකාව ඒකීය පාලන ක්‍රමයක් යටතට ගෙන ඒම
E - වෙළෙඳපොළ ආර්ථිකය වර්ධනය කිරීම උදෙසා රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**27.** 1911-1924 කාලය තුළ ක්‍රියාත්මක කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින්:
A - මැතිවරණ දේශපාලනය හරහා ආණ්ඩුකරණයට සහභාගි වීමට ජනතාවට දොර විවෘත කරනු ලැබී ය.
B - අයවැය කටයුතු සඳහා සහාය වීමට මුදල් කාරක සභාව පිහිටුවනු ලැබී ය.
C - ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජිකයින්ගේ සංඛ්‍යාව අඩු කෙරිණ.
D - ආණ්ඩුකාරවරයාගේ බලතල නොවෙනස්ව පවත්වා ගෙන යනු ලැබී ය.
E - ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජිකයින්ගේ බලතල අනුක්‍රමයෙන් වැඩි කෙරිණ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**28.** ලංකා ජාතික සංගමය:
A - බටහිර අධ්‍යාපනය ලත් උගත් මධ්‍යම පාන්තික කණ්ඩායමක් විසින් පිහිටුවන ලද සංවිධානයක් විය.
B - බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය තුළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ලබා ගැනීම අරමුණ කරගත්තේ ය.
C - කුල, වාර්ගික, ආගමික ආදී විවිධ අභ්‍යන්තරික බෙදීම් හේතුවෙන් අතිශයින්ම දුර්වල වූ සංවිධානයක් විය.
D - බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පැන නැගුන කම්කරු අරගලවලට ප්‍රතිරෝධකයක් ලෙස සංවිධානය කරන ලදී.
E - සාමාන්‍ය ජනතාවගේ ආශාවන්ට වඩා සමාජ ප්‍රභූන්ගේ ආශාවන් ගැන වැඩියෙන් සැලකිලිමත් වූ සංවිධානයක් විය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**29.** ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ සුවිශේෂී ලක්ෂණ වූයේ:
A - ස්වදේශික සහ යටත්විජිත නියෝජිතයින්ගෙන් සමන්විත වූ අමාත්‍ය මණ්ඩලයක් පැවතීම
B - ව්‍යවස්ථාදායක සහ විධායක බලතල දෙවර්ගයම පැවරූ ව්‍යවස්ථාදායකයක් තිබීම
C - සාමාන්‍ය අවස්ථාවලදී නාමික විධායකයෙකු ලෙස ක්‍රියා කළ යුතු බවට අපේක්ෂා කළ ආණ්ඩුකාරවරයකු සිටීම
D - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සියලු ම මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් විධායක කාරක සභා හතක් පැවතීම
E - අධිරාජ්‍ය ආණ්ඩුවේ අභිලාශ වෙනුවෙන් පෙනී සිටි මුර බල්ලන් නමින් හැඳින්වුන රාජ්‍ය නිලධාරීන් තිදෙනකු සිටීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**30.** 1931 දී සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම කෙරෙහි ඩොනමෝර් කොමිසමට බලපෑ සාධක:
A - සමාජයේ අවවරප්‍රසාදිත කොටස් සවිබල ගැන්වීමේ අවශ්‍යතාව
B - ආණ්ඩුකරණය තුළ සමාජ ප්‍රභූන්ගේ කතිපයාධිකාරි නායකත්වය දුර්වල කිරීමේ අවශ්‍යතාව
C - දේශපාලනඥයින් ඡන්දදායකයින්ට ඇති වගකීම වැඩි කිරීමේ අවශ්‍යතාව
D - සාමාන්‍ය ජනතාවට වඩාත් සක්‍රීය ලෙස දේශපාලනයට සහභාගි වීමට මාවත පෑදීමේ අවශ්‍යතාව
E - ජනතාව දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම මගින් යටත් විජිත පාලනයට එරෙහි හැඟීම් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**31.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංග ලක්ෂණ:
A - නාමික හා සත්‍ය යනුවෙන් නිල නාමවලින් හැඳින්වූ ද්විත්ව විධායකය
B - ලංකාව ඉල්ලා සිටින්නේ නම් ලංකාව වෙනුවෙන් නීති පැනවීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට පවරන ලද බලය
C - පහළ මන්ත්‍රී මණ්ඩලයෙන් පමණක් තෝරාපත් කරගත් නියෝජිතයින්ගෙන් සමන්විත සත්‍ය විධායකය
D - නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් සහ සෙනෙට් සභාවෙන් සමන්විත ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය
E - බ්‍රිතාන්‍ය රාජාධිකරණය මුල්කොට ගත් අධිකරණය
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**32.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය:
A - තෝරාපත් කළ සහ නාමකරණයෙන් පත්කළ සාමාජිකයින් වශයෙන් දෙවර්ගයකින් සමන්විත විය.
B - නීති සම්පාදනය සම්බන්ධයෙන් හිමිවූ බලය සීමිත විය.
C - අග්‍රාණ්ඩුකාරයා විසින් ක්‍රියාවට නැංවූ කැඳවීම, කල් තැබීම සහ විසුරුවාහැරීම යන බලතලවලට යටත්ව ක්‍රියාත්මක විය.
D - බ්‍රිතාන්‍ය කිරීටයේ කැමැත්ත සහිතව නාමික විධායකය තනතුරෙන් ඉවත් කිරීමේ බලය හිමි විය.
E - නියමිත නිල කාලයට ප්‍රථමයෙන් විසුරුවා නොහැරියහොත් පස් අවුරුදු නිල කාලයක් භුක්ති වින්දේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**33.** 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
A - ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන ජනරජයක් බවට පත් කළේ ය.
B - ජනාධිපති ආණ්ඩුක්‍රමයක් සංස්ථාපනය කළේ ය.
C - බ්‍රිතාන්‍ය කිරීටය රාජ්‍ය නායකයා වශයෙන් පිළිගැනීම අත්හළේ ය.
D - විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලතල එක්තැන් කළ ඒකමණ්ඩල ව්‍යවස්ථාදායකයක් පිහිටුවිය.
E - පූර්ව අධිකරණ විවරණ බලය සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවිය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**34.** 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය:
A - ජනාධිපති යන නිල නාමයෙන් හැඳින්විණ.
B - සිව් අවුරුදු නිල කාලයක් සඳහා අගමැතිවරයා විසින් පත් කරන ලදී.
C - නිල කාලය තුළදී සිවිල් හෝ අපරාධ නඩු පැවරීමෙන් වැළකීමේ මුක්තිය හිමිවිය.
D - පනත්වලට අවසාන අනුමැතිය දීමේ බලය හිමිවිය.
E - කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමේ දී අගමැති සහ කැබිනට් මණ්ඩලයේ උපදෙස් පිළිපැදිය යුතු විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**35.** 1978 දෙවන ජනරජ මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්
A - දෙමුහුන් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කෙරිණ.
B - අර්ධ ව්‍යවස්ථාදායක බලය සහිත ව්‍යවස්ථාදායකයක් පිහිටුවනු ලැබිණ.
C - ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය යටතේ අධිකරණ ක්‍රමය ප්‍රතිව්‍යුහගත කෙරිණ.
D - සිංහල සහ ද්‍රවිඩ භාෂා ජාතික භාෂා බවට පත් කෙරිණ.
E - ව්‍යවස්ථාවේ අන්තර්ගත රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම අධිකරණ විනිශ්චයට යටත් විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

- අංක **36** සිට **44** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ අතුරෙන් එකක් **සාවද්‍ය** වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**36.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා රාජ්‍යය:
(1) නිදහස් ස්වෛරී ස්වාධීන ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයක් වේ.
(2) ඒකීය රාජ්‍යයක් වේ.
(3) ජනරජයක් වන අතර එහි පරමාධිපත්‍ය බලය ජනතාව සතු වේ.
(4) ස්වාධීන ස්වෛරී පළාත් නවයකින් සමන්විත ජනරජයක් වේ.
(5) බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දී ඇති ජනරජයකි.

More Past Papers at
tamilguru.lk

**37.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පුරවැසියන් ඉටු කළ යුතු මූලික යුතුකම් සහ බැඳීම් කිහිපයක් වන්නේ:
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කොට අනුගමනය කිරීම
(2) ජාතික අභිලාශ වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම
(3) තමන්ගේ ආගම සහ භාෂාව වර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
(4) පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම සහ පොදු දේපළ අයථා ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහිව කටයුතු කිරීම
(5) සෙසු අයගේ අයිතිවාසිකම් සහ නත් වැදැරුම් නිදහස ගරු කිරීම

**38.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන වගන්තියට අනුව ජනරජයේ පරමාධිපත්‍ය බලය ජනතාව සතුවේ. 4 වන වගන්තියට අනුව ජනතාව සතු පරමාධිපත්‍යය ක්‍රියාවට නැංවිය යුත්තේ:
(1) ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුව සහ ජනමත විචාරණ මගිනි.
(2) ජාතික ආරක්ෂාව ඇතුළු විධායක බලය ජනතාව තෝරාපත් කරන ජනාධිපතිවරයා මගිනි.
(3) අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ වෙනත් නීතිවලින් පිහිටුවන අධිකරණ මගින් පාර්ලිමේන්තුව විසිනි.
(4) සර්වජන ඡන්ද බලය මැතිවරණ සහ ජනමත විචාරණ මගිනි.
(5) මූලික අයිතිවාසිකම් නීතිපතිවරයා මගිනි.

**39.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රදානය කර ඇති මූලික අයිතිවාසිකම්:
(1) සියලු ම පුද්ගලයින්ට භුක්ති විඳිය හැකි සහ පුරවැසියන්ට පමණක් භුක්ති විඳිය හැකි යනුවෙන් වර්ග දෙකකින් යුක්ත වේ.
(2) විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් උල්ලංඝනය වූ විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වගන්තිය යටතේ අධිකරණ විනිශ්චයට යොමු කළ හැකි ය.
(3) භුක්ති විඳිය හැක්කේ ව්‍යවස්ථාවේ 15 වගන්තියේ දක්වා තිබෙන සීමාවලට යටත්ව ය.
(4) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අන්තර්ගත සියලු අයිතිවාසිකම්වලට අනන්‍යසම වේ.
(5) ආණ්ඩුවේ සියලු ම ආයතන විසින් පිළිගැනීම, ගරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කළ යුතු ය.

**40.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(1) වගන්තියට අනුව ජනාධිපතිවරයා ආණ්ඩුවේ ප්‍රධානියා වේ. ඒ අනුව ජනාධිපතිවරයා:
(1) කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින් පත් කරමින් ඔවුන්ට අමාත්‍යාංශ පවරා දෙයි.
(2) කැබිනට් රැස්වීම්වල මුලසුන දරයි.
(3) රාජ්‍ය ප්‍රතිපත්තිවලට අවසාන අනුමැතිය දෙයි.
(4) අමාත්‍යාංශ ලේකම්වරුන් පත්කරයි.
(5) පාර්ලිමේන්තුවේ කතානායකවරයා පත්කරයි.

**41.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කැබිනට් මණ්ඩලය:
(1) පාර්ලිමේන්තුවේ නියෝජිතයින් අතුරින් තෝරාගත් සාමාජිකයින්ගෙන් හා ජනාධිපතිවරයා/වරියගෙන් සමන්විත වේ.
(2) ආණ්ඩුව මෙහෙය වීම හා ඒ පිළිබඳ පාලනය භාරව ක්‍රියා කළ යුතු වේ.
(3) පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට බැඳී සිටී.
(4) පාර්ලිමේන්තුවේ සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් විසුරුවා හැරීමට යටත් ය.
(5) අවම වශයෙන් මසකට වරක්වත් රැස්වීම් පැවැත්විය යුතු ය.

**42.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ පාර්ලිමේන්තුව:
(1) පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය මූලධර්මය යටතේ පිහිටුවා ඇත.
(2) සාමාජිකයින් 225න් සමන්විත වන අතර එයින් 196ක් ජනතාව විසින් ද ඉතිරිය නාමකරණයෙන් ද පත්කරනු ලැබේ.
(3) 19 වන සංශෝධනය මගින් එහි නිල කාලය අවුරුදු පහකට සීමා කර ඇත.
(4) අවම වශයෙන් සෑම වර්ෂයකම එක් වරක්වත් රැස්විය යුතු ය.
(5) එයට හිමි ව්‍යවස්ථාදායක බලය අත්නොහළ යුතු අතර කිසිම ආකාරයකින් අන්සතු නොකළ යුත්තේ ය.

**43.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ අධිකරණ ක්‍රමය:
(1) ජනතාව සතු අධිකරණ බලය පාර්ලිමේන්තුව විසින් ක්‍රියාවට නංවන හස්තය වේ.
(2) ඉහළ සහ පහළ අධිකරණ වශයෙන් මට්ටම් දෙකකින් යුක්ත ය.
(3) අධිකරණ සේවා කොමිසමේ මෙහෙය වීම සහ පාලනය යටතේ ක්‍රියාත්මක විය යුතු ය.
(4) ඉහළ අධිකරණ දෙකකින් සහ පහළ අධිකරණ වර්ග කිහිපයකින් සමන්විත වේ.
(5) ව්‍යුහගත කර තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය යටතේ වන අතර එය උසස්ම හා අවසාන උත්තරීතර අධිකරණය වේ.

[අටවැනි පිටුව බලන්න.

**44.** 1978 ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද 19 වන සංශෝධන යටතේ ජනාධිපතිවරයාට පැවරුණු නව කාර්යයන් හා වගකීම් වන්නේ:

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම
(2) ජාතික ප්‍රතිසංධානය සහ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම
(3) රාජ්‍ය සේවයේ දූෂණ සහ අල්ලස් තුරන් කිරීම සඳහා නව නීති පැනවීම
(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII අ පරිච්ඡේදයේ සඳහන් ආයතනවල විධිමත් ක්‍රියාකාරිත්වය සහතික කිරීම හා පහසු කිරීම
(5) නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණය නිර්මාණය කිරීම සහ තහවුරු කිරීම

- අංක **45** සිට **50** දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන කවර ප්‍රකාශය දැ'යි සඳහන් කරන්න.

**අංක 1 වගුව සඳහා යොමුව**

| අංකය | ප්‍රකාශය 1 | ප්‍රකාශය 2 |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

**වගුව 1**

| | ප්‍රකාශය 1 | ප්‍රකාශය 2 |
|---|---|---|
| **45.** | ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා තෝරන්නේ නියෝජිතයින් 536 දෙනෙකුගෙන් සමන්විත ඡන්ද විද්‍යාලයක් මගිනි. | වොෂින්ටන් DC හැරුණු විට අනෙක් සෑම ප්‍රාන්තයකටම ඒවායේ භූමිය සහ ජනගහනය අතර පවතින වෙනස්කම් නොසලකමින් සමාන නියෝජිත සංඛ්‍යාවක් ඡන්ද විද්‍යාලයට තෝරාපත් කිරීමේ හිමිකම ඇත. |
| **46.** | බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අලිඛිත බව පොදුවේ පිළිගැනේ. එම හේතුවෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය එකක් වන බව ද පොදුවේ පිළිගැනේ. | එබැවින් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා විශේෂිත ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම අවශ්‍ය නොවන අතර එකී ව්‍යවස්ථා සංශෝධනය සාමාන්‍ය බහුතර ඡන්දයෙන් සම්මත කරගත හැකි ය. |
| **47.** | ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ ජනාධිපතිවරයා සිව් අවුරුදු නිලකාලයක් සඳහා ඡන්ද විද්‍යාලයක් මගින් තෝරාපත් කරන අතර ඡන්ද විද්‍යාලය සමන්විත වන්නේ මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ සියලු ම මන්ත්‍රීවරුන්ගෙනි. | ඇමරිකා එක්සත් ජනපදයේ මෙන් ඉන්දියාව තුළ ජනාධිපති තනතුරට එක් පුද්ගලයෙකුට පත්විය හැකි වාර ගණන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමාකර නැති අතර එක් පුද්ගලයෙකුට ඕනෑම වාර ගණනක් තේරී පත් විය හැක. |
| **48.** | ප්‍රංශය තුළ ආණ්ඩුවේ සියලුම සාමාජිකයින් අගමැතිවරයා විසින් තම අභිමතය පරිදි පත් කරනු ලැබේ. | ප්‍රංශයේ ආණ්ඩුව තම කාර්යයන් සම්බන්ධයෙන් ජාතික මන්ත්‍රණ සභාවට වගකිව යුතු අතර වගකීම කඩකරන විට විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් ආණ්ඩුව බලයෙන් ඉවත් කිරීමට ජාතික මන්ත්‍රණ සභාවට හැකියාව තිබේ. |
| **49.** | රාජ්‍යය තුළ ජීවත් වන ජනතාවගේ සමාජ යහපත ඉහළ දැමීමේ අරමුණු ඉටු කර ගැනීම හා සම්බන්ධ ආණ්ඩුවල ක්‍රියා රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස අර්ථකථනය කළ හැක. | එම කාර්යයන් බෙදාහැරීම්, බදු අයකිරීම්, නියාමනය හා සංකේතාත්මක යනුවෙන් කොටස් හතරකට වර්ග කළ හැකි ය. |
| **50.** | අන්තර්ජාතික දේශපාලනය සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ ජාතික අභිලාෂ වර්ධනය කිරීම ඉලක්ක කරගෙන ජාතීන් අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙස ය. | අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයින් අන්තර් රාජ්‍ය සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන වේ. |

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

51743

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | | |
|---|---|---|
| දේශපාලන විද්‍යාව II<br>அரசியல் விஞ்ஞானம் II<br>Political Science II | 23 S II | 2018.08.17 / 1400 - 1710 |

| | |
|---|---|
| පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය: ....................................

| | |
|---|---|
| A කොටස | |
| මුළු ලකුණු | 20 |

**උපදෙස්:**

✳ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් **තුනකින්** යුක්ත ය.

✳ **A** කොටස තුළ කෙටි ප්‍රශ්න **20** ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු **01** ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු **1/2** ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා **B** හා **C** කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

✳ **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** පහත දැක්වෙන ප්‍රකාශවලින් විස්තර කෙරෙන දේශපාලන සංවිධාන **දෙක** හඳුනාගෙන නම් කරන්න.

(i) සියලුම සමාජ සංවිධානවලට වඩා උත්තරීතර වූ සර්වබලධාරී දේශපාලන සංවිධානය

(ii) රාජ්‍යයේ කැමැත්ත ක්‍රියාවට නංවන දේශපාලන ආයතනය

(1) ..................................................................................

(2) ..................................................................................

**2.** පහත දැක්වෙන ප්‍රකාශ දෙක මගින් නූතන ලෝකයේ පවතින ආණ්ඩුක්‍රමයක් සහ රාජ්‍ය මාදිලියක් විස්තර කර ඇත. ඒවා හඳුනාගෙන නම් කරන්න.

(i) ජනතාව විසින් ජනතාව උදෙසා ක්‍රියාවට නංවන ජනතාවගේ ආණ්ඩුව

(ii) රාජ්‍යය තුළ ජීවත්වන ජනතාවට සමාජ සේවා සහ සමාජ ආරක්ෂණය සපයන රාජ්‍යය

(1) ..................................................................................

(2) ..................................................................................

**3.** පහත දැක්වෙන ප්‍රකාශ (i) සහ (ii) මගින් විස්තර කෙරෙන්නේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන උපකරණ **දෙකකි.** ඒවා හඳුනාගෙන නම් කරන්න.

(i) "එය ප්‍රංශ භාෂාවේ භාවිත වන පදයක් වන අතර එහි අර්ථය වන්නේ 'අදහස් විමසිය යුතු ය' යන්න ය. මේ අනුව එමගින් අදහස් කෙරෙන්නේ ජනතා තීන්දුව උදෙසා යම් පනතක් ජනතාවට හෝ ඡන්දදායකයින්ට හෝ යොමු කළ යුතු ය යන්න ය. එය නීති සම්පාදන ක්‍රියාමාර්ගයක් වන අතර ඒ අනුව ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන ලද පනතක් ඡන්දදායකයින් විසින් අනුමත කරන තෙක් නීතියක් බවට පත් නොවේ."

[දෙවැනි පිටුව බලන්න.

(ii) "මෙම උපකරණය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දක්වන නිශ්චිත ඡන්දදායක සංඛ්‍යාවකට පනතක් යෝජනා කර ව්‍යවස්ථාදායකයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ විටෙක එසේ කිරීමට ව්‍යවස්ථාදායකය බැඳී සිටී. අනතුරුව අදාළ පනත ව්‍යවස්ථාදායකය විසින් ජනතාවගේ අනුමැතිය හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සඳහා ඉදිරිපත් කළ යුතු ය. මෙම උපකරණය භාවිත කිරීමේ අරමුණ වන්නේ නීති සම්පාදනය යෝජනා කිරීමේ බලය ජනතාව අතට පත් කිරීම ය."

(1) ..........................................................................................

(2) ..........................................................................................

**4.** පහත දැක්වෙන ප්‍රකාශ (i) සහ (ii) මගින් අදහස් කෙරෙන්නේ කුමක් ද යන්න නම් කරන්න.

(i) එය මානව ප්‍රජාව විස්තර කිරීම සඳහා භාවිතයට ගැනෙන පදය වන අතර රාජ්‍යය ඓතිහාසික වශයෙන් පැනනැගුනේ ඒ තුළිනි.

(ii) පොදු බැඳීම් එනම් භාෂාව, ආගම, වර්ගය, භූමිය සහ ඉතිහාසය වැනි අනන්‍යතා මත ගොඩනැගුණු පොදු සංස්කෘතිය පිළිබඳ හැඟීම බෙදාහදා ගන්නා මනුෂ්‍ය කණ්ඩායමක් ය.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**5.** පහත දැක්වෙන ප්‍රකාශ මගින් විස්තර කෙරෙන දේශපාලන න්‍යායන් **දෙක** නම් කරන්න.

(i) බලය අධික වශයෙන් කේන්ද්‍රගත වීම වැළැක්වීමේ සංරෝධකයක් ලෙස දේශපාලන බලය රාජ්‍යයේ විවිධ ආයතන අතර බෙදා හැරිය යුතු බව ප්‍රකාශ කරන සිද්ධාන්තය

(ii) නීතිය ඉදිරියේ සමාන බව සහ නීතියේ සමාන ආරක්ෂාව සියලු දෙනාටම හිමිවිය යුතු බව සහතික කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්මය

(1) ..........................................................................................

(2) ..........................................................................................

**6.** රාජ්‍යයේ ආරම්භය, පරිණාමය සහ අවසානය පිළිබඳව අවධි පහක් මාක්ස්වාදී න්‍යායයෙන් යෝජනා වේ. එහි අවසාන අවධි **දෙක** දක්වන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**7.** සමාජ සම්මුතිවාදය රාජ්‍යයේ ආරම්භය පිළිබඳව ඉදිරිපත් වී ඇති දේශපාලන න්‍යායක් වේ. එම න්‍යායේ එක් ආරම්භකයෙකු විසින් අසහාය බලැති රාජාණ්ඩුක්‍රමයක් යෝජනා කරන ලද අතර තවත් අයෙකු විසින් නියෝජන ආණ්ඩුක්‍රමය යෝජනා කර ඇත. ඒ **දෙදෙනා** නම් කරන්න.

(1) අසහාය බලැති රාජාණ්ඩුක්‍රමය ..........................................................................................

(2) නියෝජන ආණ්ඩුක්‍රමය ..........................................................................................

**8.** පහත දැක්වෙන ප්‍රකාශ **දෙක** මගින් විස්තර කෙරෙන්නේ කුමක් ද යන්න හඳුනාගෙන ඒ **දෙක** නම් කරන්න.

(i) "ආණ්ඩුවේ විශේෂිත ප්‍රතිපත්තිවලට බලපෑම් කරන හෝ ඒවා පාලනය කිරීමට උත්සාහ කරන නමුත් ආණ්ඩු බලය අත්පත් කර ගැනීමට හෝ ආණ්ඩුවේ ප්‍රතිපත්ති මුළුමනින්ම පාලනය කිරීමට හෝ උනන්දු නොවන පුද්ගලික සහ ස්වේච්ඡා සංවිධාන."

(ii) "මෙම පදය පොදුවේ භාවිත කෙරෙන්නේ ප්‍රජාවට බලපාන හෝ ප්‍රජාවේ උනන්දුව ඇති කරවන කරුණු පිළිබඳ ව මනුෂ්‍යයන් දක්වන අදහස්වල සමස්තය හැඳින්වීමට ය. මේ අනුව ඒ වූ කලී විවිධ අදහස්, විශ්වාස, මිථ්‍යා, අගතීන් සහ අපේක්ෂාවල මිශ්‍රණයකි."

(1) ..........................................................................................

(2) ..........................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

**9.** ස්වාධිපත්‍ය බලය රාජ්‍ය අධිකාරී බලයේ මූලාශ්‍රය ලෙස සැලකේ. නූතන ලෝකය තුළ ආණ්ඩුක්‍රම ආකෘති දෙකක් යටතේ රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය ක්‍රියාවට නැංවීම සංවිධානය කර ඇත. එම ආකෘති **දෙක** නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

**10.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ නියෝජනය පදනම් කරගෙන ය. නියෝජනය සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසි දෙකක් තිබේ. එම කොන්දේසි **දෙක** නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

**11.** (i) ශ්‍රී ලංකාව තුළ ව්‍යවස්ථාදායක සභාවක් ප්‍රථමවරට පිහිටුවූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ ද?

(ii) ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ ද?

(1) ................................................................................................

(2) ................................................................................................

**12.** ශ්‍රී ලංකාව තුළ (i) සීමිත ඡන්ද බලය හඳුන්වා දුන්

(ii) සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

**13.** ශ්‍රී ලංකාව තුළ (i) වාර්ගික නියෝජනය හඳුන්වාදුන්

(ii) වාර්ගික නියෝජනය අහෝසි කළ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ නම් කරන්න.

(1) ................................................................................................

(2) ................................................................................................

**14.** (i) ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රථම වරට හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?

(ii) රාජ්‍ය සේවාව දේශපාලන විධායකය යටතට පත්කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කළේ කුමන ව්‍යවස්ථාව යටතේ ද?

(1) ................................................................................................

(2) ................................................................................................

**15.** (i) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද ඉහළ අධිකරණ දෙකක් තිබේ. එම අධිකරණ **දෙක** නම් කරන්න.

(ii) ඉහළ අධිකරණ දෙකෙහි විනිශ්චයකරුවන් පත් කිරීම හා සම්බන්ධ කාර්ය පටිපාටිය කුමක් ද?

(1) ................................................................................................

(2) ................................................................................................

මෙතැනින් කපන්න

[හතරවැනි පිටුව බලන්න.

**16.** (i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ සංශෝධනයක් මගින් ශ්‍රී ලංකාව තුළ පළාත් සභා ස්ථාපිත කරන ලදී. එම සංශෝධනය නම් කර එය ගෙන එනු ලැබූ වර්ෂය දක්වන්න.

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන පළාත් පාලන ක්‍රමය සමන්විත වන්නේ පළාත් පාලන ආයතන වර්ග තුනකිනි. එම පළාත් පාලන ආයතන වර්ග **තුන** නම් කරන්න.

(1) ..........................................................................

(2) ..........................................................................

**17.** (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තීරණ ගැනීමේ ඉහළම ආයතනය කුමක් ද?

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා පත්කිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?

(1) ..........................................................................

(2) ..........................................................................

**18.** (i) කලාපීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා දකුණු ආසියාතික රටවල් විසින් ස්ථාපනය කරන ලද සංවිධානය කුමක් ද?

(ii) රැස්වීම් වාරවල දී සාකච්ඡාවට භාජනය **නොකළ යුතු** කරුණු දෙකක් එම සංවිධානයේ සමාරම්භක ප්‍රකාශනයේ සඳහන් වේ. එම කරුණු **දෙක** නම් කරන්න.

(1) ..........................................................................

(2) ..........................................................................

**19.** (i) ජාත්‍යන්තර හා දේශීය ගැටුම්වලදී වින්දිතයින් බවට පත්වන අයගේ ජීවිතය සහ ආත්ම අභිමානය ආරක්ෂා කිරීම වෙනුවෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය සමග බද්ධ වී කටයුතු කරන ප්‍රධාන රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයා කවුරුන් ද?

(ii) එම සංවිධානයේ මූලස්ථානය පිහිටුවා ඇත්තේ කවර නගරයේ ද?

(1) ..........................................................................

(2) ..........................................................................

**20.** (i) යුරෝපීය ජාතීන් අතර ඒකාග්‍රතාව ඇති කිරීම උදෙසා ක්‍රියාකරන සංවිධානය කුමක් ද?

(ii) මේ වන විට එම සංවිධානයෙන් ඉවත් වීමට තීරණය කර ඇති රට කුමක් ද?

(1) ..........................................................................

(2) ..........................................................................

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

**දේශපාලන විද්‍යාව II**
அரசியல் விஞ்ஞானம் II
Political Science II

**23 S II**

**උපදෙස්:**
✻ **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

**1.** රාජ්‍යය යනු සමාජයේ පවත්නා උත්තරීතර සංවිධානය ලෙස සලකනු ලබන්නේ ඇයි? (ලකුණු 20 යි.)

**2.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
(i) ආණ්ඩුවේ ස්වභාවය
(ii) ආණ්ඩුවේ කාර්යයන්
(iii) ආණ්ඩුක්‍රම වර්ගීකරණය

(ලකුණු 10 × 2 = 20 යි.)

**3.** පහත දැක්වෙන සංකල්ප අතුරෙන් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
(i) නීතියේ ආධිපත්‍යය
(ii) බලතල වෙන් කිරීම
(iii) ව්‍යවස්ථානුකූලවාදය

(ලකුණු 10 × 2 = 20 යි.)

**4.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** විස්තර කරන්න.
(i) රාජ්‍ය-පුරවැසි සම්බන්ධතාව
(ii) සිවිල් සමාජය
(iii) යහපාලනය

(ලකුණු 10 × 2 = 20 යි.)

## C කොටස

**5.** ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික හා සමාජ පරිවර්තනය සඳහා කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

**6.** "ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ නව යුගයක් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් සනිටුහන් කළේ ය." සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

**7.** පහත දැක්වෙන ආයතන අතුරෙන් ඕනෑම **දෙකක්** පිළිබඳ ව සාකච්ඡා කරන්න.
(i) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය
(ii) 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය
(iii) සෝල්බරි ව්‍යවස්ථාව හා 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය

(ලකුණු 10 × 2 = 20 යි.)

More Past Papers at
tamilguru.lk

**8.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද පහත දැක්වෙන සංශෝධන අතුරෙන් ඕනෑම **දෙකක්** තෝරාගෙන ඒවායේ මූලික අංග ලක්ෂණ සඳහන් කරන්න.
(i) 2001 වර්ෂයේ 17 වන ව්‍යවස්ථා සංශෝධනය
(ii) 2010 වර්ෂයේ 18 වන ව්‍යවස්ථා සංශෝධනය
(iii) 2015 වර්ෂයේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය

(ලකුණු 10 × 2 = 20 යි.)

✻ ✻ ✻